# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 7 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 පෙබරවාරි මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1975 පෙබරවාරි මස 28 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 7 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 පෙබරවාරි මස 10 වන දින]

එල්.ඩී.—ඕ. 14/72.

**සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 7 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතෙහි 3 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 129 වන අධිකාරයෙහි 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

" (1) (3) වන උපවගන්තියේ සඳහන් යම් නියෝගයක විධිවිධානවලට යටත්ව සහ (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් සාප්පුවක හෝ කාර්යාලයක කටයුතුවල හෝ එම කටයුතු සම්බන්ධයෙන් හෝ යම් තැනැත්තකු සේවයේ යොදවනු ලැබිය හැකි සාමාන්‍ය කාලය—

(අ) කිසියම් එක් දිනයක පැය අටක් නොඉක්ම විය යුතු ය, තවද

(ආ) කිසියම් එක් සතියක පැය හතලිස් පහක් නොඉක්ම විය යුතු ය.

මේ උපවගන්තියේ සඳහන් කරනු ලැබූ කාලයට මේ පනතේ යම් විධිවිධානයක් යටතේ විවේක ගැනීම සඳහා හෝ ආහාර ගැනීම සඳහා ඉඩ දෙනු ලැබූ යම් විවේක කාලයක් හෝ (3) වන උපවගන්තියෙහි සඳහන් යම් නියෝගයකින් අවසර දෙනු ලැබූ වැඩ නවත්වා තැබීමේ කාලයක් ඇතුළත් නොවන්නේ ය." ; තවද

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

'(5) පොදු ආයතනයක විධායක හෝ කළමනාකාර තත්ත්වයක් දරන්නා වූ ද, වැටුප් පරිමාණයෙහි මූලික වැටුප වර්ෂයකට රුපියල් 6,720 කට නොඅඩු වන්නා වූ

2—ජ 10784—9,187 (74/11)

ඒකාබද්ධ මැටුපක් ලබන්නා වූ ද යම් තැනැත්තකුට (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවන්නේ ය. කිසි යම් තැනැත්තෙක් විධායක හෝ කළමනාකාර තත්ත්වයක් දරන්නේ ද යන්න පිළිබඳ යම් ප්‍රශ්නයක් උද්ගත වන අවස්ථාවක ඒ ප්‍රශ්නය කොමසාරිස්වරයා විසින් තීරණය කළ යුතු අතර ඔහුගේ තීරණය අවසානාත්මක සහ තීරණාත්මක වන්නේ ය.

මේ උපවගන්තියේ "පොදු ආයතනය" යන්නට 1971 අංක 38 දරන මුදල් පනතේ 24 වන වගන්තියෙන් ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.'.